## පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමියන් පැවැත්වූ ධර්ම දේශනා

# තණ්හා ගඟ නතරවන්නේ කොතැනින් ද?



(පොල්ගහවෙල මහමෙවුනා භාවනා අසපුවේ පැවැති භාවනා වැඩමුළුවක දී පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි පැවැත්වූ ධම්මදේශනා මාලාවක් මෙහි කොටස් වශයෙන් පළවේ. මුල් කොටස් පසුගිය සතිවල පළ විය.)

දැන් අපි බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයට අනුව බලමු.

අපේ ඇස, කන, නාසය, දිව, ශරීරය, සිත ඉබේ හට ගන්න එකක්ද? මේ ආයතන හය (සළායතන) නාම රූප නිසා හටගන්න එකක්. අපි කතා කළා ස්පර්ශය ගැන. ඒ ස්පර්ශය ඉබේ ඇති වෙච්ච එකක් ද? නැහැ. ඇසයි – රූපයයි, සිතයි නිසා හටගත් එකක්. ඒ වගේම කන, නාසය, දිව, ශරීරය, සිත කියන ආධ්‍යාත්මික ආයතනත්, බාහිර ආයතනත්, සිත සමඟ එක්වූ නිසයි ස්පර්ශය සකස් වුණේ.

ඊළඟට අපි සැප, දුක්, උපේක්ෂා වේදනා ගැන කිව්ව. ඉතින් ඒ වේදනා ඉබේ හටගත්තද? නැහැ. එහෙනම් කුමක් නිසා ද ඒ වේදනා හටගත්තෙ? ස්පර්ශය නිසා. ඊළඟට අපි කිව්ව රූප හඳුන ගන්නව. ශබ්ද හඳුන ගන්නව. ගන්ධ හඳුන ගන්නව. රස හඳුන ගන්නව. හැපීම් හඳුන ගන්නව. සිතිවිලි හඳුන ගන්නව කියල.

ලෝකාන්තය

මේ හඳුනා ගැනීම ඉබේම හටගන්න එකක්ද? නැහැ. ඒකත් ස්පර්ශය නිසා හටගත්තෙ. එතකොට මේ හඳුනගන්නව කියන්නෙ ස්පර්ශය නිසා සිදුවන දෙයක්. ඊළඟට හඳුනාගත් දේ අනුව චේතනා පහළ කරනව. රූප අනුව රූප සංචේතනා, ශබ්ද අනුව ශබ්ද සංචේතනා, රස අනුව රස සංචේතනා, පහසට අනුව පොට්ඨබ්බ සංචේතනා, සිතිවිලි අනුව ධම්ම සංචේතනා පහළ කරනව. මේ චේතනා ඇතිවීම ඉබේ හටගත් දෙයක්ද? නැහැ. ඒක කුමක් නිසා හටගත් දෙයක්ද? ඒකත් ස්පර්ශය නිසා හටගත් දෙයක්. එතකොට ස්පර්ශය වෙනස්වීමෙන් මේ ඔක්කොම වෙනස් වෙනව. වෙනස් වෙලා යනවා. මේ ඔක්කොම තියෙන්නෙ ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන. අර කිව්ව චේතනාවක් පහළ වුණාම කර්ම රැස් වෙනවා කියන එක තමයි අපට තියන බැරෑරුම් ප්‍රශ්නය. මොකද ඒක ධර්ම න්‍යායයක්. ඒ භයානක වූ කර්ම රැස් වීම, මේ ධර්ම න්‍යාය වෙනස් කරන්න පුළුවන් වෙන්නෙ බුදු රජාණන් වහන්සේගේ ධර්මය පිළිසරණය කරගෙන පමණයි. වෙන කිසිම බාහිර ක්‍රමයකින් මේකෙන් නිදහස් වෙන්න බැහැ. වෙන විධියකින් මේකෙන් පැනල යන්න බැහැ.

එක්තරා අවස්ථාවක රෝහිතස්ස කියල දිව්‍ය පුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිත් ප්‍රශ්නයක් ඇහුව.

"භාග්‍යවතුන් වහන්ස, ගමන් කිරීමෙන් මේ ලෝකයෙ අන්තයට යන්න පුළුවන් ද?"

බුදුරජාණන් වහන්සේ පිළිතුරු දුන්නා.

"දේව පුත්‍රය, ගමනින් ඒ වැඩේ කරන්න බැහැ"

එවිට දේව පුත්‍රයා මෙසේ කීවා.

"හරියට හරි, භාග්‍යවතුන් වහන්ස, මට මීට පෙර ආත්මයක වේගයෙන් ගමන් කරන්න පුළුවන් ශක්තියක් තිබුණා. ඉතින් මා කල්පනා කළා මගේ මේ ජවය නිසා මට මේ ලෝකයේ අන්තයට යන්න පුළුවන් වෙයි කියල. මම අවුරුදු සීයක්ම දිගට ගමන් කළා. මගේ ඒ ජීවිත කාලයේදීම එය කරන්නට බැරිව ගියා. මා අතර මගදී මළා."

එවිට බුදු රජාණන් වහන්සේ ගමන් කොට අවසන් කරන්නට බැරි මේ ජීවිතය අවසන් කරන පිළිවෙළ බොහෝම ලස්සනට කියා දුන්නා. උන්වහන්සේගෙ විග්‍රහයට අනුව හැඟීමක් සහිත සිතකින් යුත් බඹයක් පමණ වූ මේ ශරීරය තමයි ලෝකය. මේක තමයි ලෝකයේ හට ගැනීම. මේකෙන් මිදුණොත් ලෝකයෙන් මිදුණා තමයි. මේක අවබෝධ කර ගැනීමේ මග තමයි ලෝකයෙන් මිදෙන මග. ඔහුට පැහැදිලි කළා.

ලෝකයෙන් මිදීම

ලෝකෙ තියෙන්නෙ තමන් ළඟ. ලෝකෙ හදන්නෙ තමන්. ලෝකෙ හැදීම නැවැත්තුවොත් ලෝකෙන් මිදෙනව. ඒකට මඟක් තියෙනවා. ඒක අනුගමනය කරන්න. මොකක්ද එතකොට උන්වහන්සේ දෙන පතිවුඩය. ඒ සඳහා මගක් තියෙනව. ඒක අනුගමනය කරන්න.

එතකොට මොකක්ද අපට කරන්න තියෙන්නෙ? ඒ මාර්ගය අනුගමනය කරන්න ඕන. අඬ අඬා හරි, හිනා වෙමින් හරි, මාර්ගය අනුගමනය කළොත් මොකද වෙන්නෙ? ගමන කෙළවර කරනව. ගමන යන්නෙ නැතිව අපි වැඳ වැඳ හිටියොත් "අනේ මට යන්න ලැබේවා" කියමින් ගමන යයිද? යන්නෙ නැහැ. බුදු රජාණන් වහන්සේ ඒකට ලස්සන උපමාවක් කියල දුන්නා. "භූමිජ කියන හාමුදුරුවන් ජයසේන කියල රාජ කුමාරයෙක් ඇවිල්ල භූමිජ කියන හාමුදුරුවන්ට කිව්ව මම මෙන්න මෙහෙම අදහසක් දරනව. මොකක්ද? මේ ලෝකෙ යම් කෙනෙක් විමුක්තියක් පිණිස කොච්චර මහන්සි ගත්ත ද කොච්චර වීරිය කළත් විමුක්තියක් ලබන්න බැහැ. ඒක බොරුවක්. හිත දියුණු කරනවා කියන එක බොරුවක්" කියල කිව්ව. එතකොට භූමිජ හාමුදුරුවො මෙහෙම කිව්වා.

"මම ඉගෙන ගෙන තියෙන්නෙ ඔය විදියට නොවෙයි. යමෙක් යම් ප්‍රතිපදාවක්, යම් වැඩපිළිවෙළක් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ ඥානවන්තව අනුගමනය කළොත් ඒකෙ ප්‍රතිඵලයක් තියෙනව."

ඉන්පසු ඒ හිමියන් බුදුරජාණන් වහන්සේ හමුවී අර කුමාරයා පැවැසූ අදහසත්, ඊට තමා දුන් පිළිතුරත් කීවා.

බුදු හාමුදුරුවන් ඒ අවස්ථාවේ උපමාවක් දක්වමින් මේ සඳහා කදිම පිළිතුරක් දුන්නා.

යථා භූත ඥානය

"කිරි වුවමනා අයෙක්, එළ කිරිවලින් ප්‍රයෝජනයක් තියෙන කෙනෙක් එළදෙනක් ළඟට යනව. "අනේ මට කිරි ලැබියන් කියල යාඥා කරමින් වැස්සිගෙ අං දෙකෙන් අදිනව. ඉතින් ඔහුට කිරි ලැබේ ද? නැහැ. ඇයි? අං දෙකෙන් කිරි දෙවන්න බැහැ. තවත් කෙනෙක් එසේ ප්‍රාර්ථනා නොකර මට කිරි ලැබේවා කියල එළදෙනගෙ තන බුරුල්ලෙන් අදිනව. මොකද වෙන්නේ කිරි එනවා. මෙන්න මේ වගේ තමයි යම් කෙනෙක් අනේ මට සසර දුකෙන් මිදෙන්න ලැබේවා කියමින් උදේ සවස ප්‍රාර්ථනා කළාට එය ලැබෙන්නෙ නැහැ. අධිෂ්ඨාන බලයකින් එය ලැබෙන්නෙ නැහැ. දුක් වින්ද පමණින් ලැබෙන්නෙත් නැහැ. එහෙනම් කරන්න වැඩ පිළිවෙළක් තියෙනව. ඒ වැඩ පිළිවෙළ තමයි යථා භූත ඥානය ඇති කර ගන්න එක.

මම මුලින්ම කිව්වනේ මෙය නිකම්ම ලැබෙන්නෙ නැහැ. කරුණු පහක් ඕන වෙනවා කියලා. ඒ තමයි සද්ධා, හිරිඔත්තප්ප, වීරිය, පඤ්ඤා, මතක තබා ගන්න මේ පහ තමන් තුළ තිබෙනවා නම් භයක් ඇති කර ගන්න එපා. කිසිසේත්ම නරක තැනක උපදින්නෙ නැහැ. තමා තමන්ම රක්ෂණය කර ගන්නා වගේ. තමා පිළිබඳව තමාටම සහතික වෙන්න පුළුවන්. කිසිසේත්ම නරක තැනක උපදින්නෙ නැහැ. හැබැයි තමා තුළ මේවා තිබෙන බව තමා දකින්න ඕන. නැති අයට මේවා ඇති කරගන්න පුළුවන්.

විදර්ශනාව

ඊළඟට කරන්න තියෙන්නෙ හේතුඵල දහමක් හැටියට මේ ජීවිතේ තේරුම් ගැනීම. අපි විදර්ශනාවට බැස ගත්ත කියමු. දැන් ඔන්න ඇහින් රූපයක් දැකල හිතේ රාග, ද්වේශ, මෝහ ඇති වුණා, කියමු. එතන මොකක්ද වුණේ කියල විමසල බලනව. ඉස්සරවෙලාම සිදුවෙන්නෙ ස්පර්ශය, ඇසයි, රූපයයි, සිතයි එකතුවීම. ඒක තමයි ස්පර්ශය, එකතු වූ ගමන් විඳීමක් ඇතිවෙනව. ඊළඟට විඳින දේ හඳුනා ගන්නව. හඳුනාගන්න දේ චේතනාවකින් තමයි සිතින් සිතන්න පටන් ගන්නෙ. එතකොට එක්කෝ සිත ගැටෙනවා. නැත්නම් ඇලෙනවා. එක්කෝ මුළා වෙනව. ඔන්න කර්ම රැස්වෙන පදනම. දැන් මේක තමන්ගෙ ජීවිතය තුළ සිහියෙන් බලන්න පුරුදුවෙන්න ඕන. එතකොට තමන්ට බලන්න පුළුවන් චේතනාවක් මුල්වෙලා සිත, කය, වචනය ක්‍රියාත්මක වන හැටි. හොඳට සිහියෙන් නුවණින් මේක බලන්න පුළුවන් එකක්. උන්වහන්සේ වදාළේ ප්‍රහේලිකා නොවෙයි. තේරවිලි නොවෙයි. අවබෝධ කරගන්න පුළුවන් ධර්මයක්. හැබැයි ඉතින් මේකට සියුම් නුවණක්, උත්සාහයක්, කැපවීමක් තියෙන්න ඕන.

ඔන්න දැන් අපි චේතනාව මුල් කරගෙන වඩන්නෙ මොකක්ද? විදර්ශනාව.

යෝනිසෝමනසිකාරයෙන් අපි මේවා බලන්න පටන්ගත්තාම අපට පේනව හරි. ස්පර්ශය කියන්නෙ කරුණු තුනක එකතුවක්, ඔන්න අපි ඒක තේරුම් ගන්නව. ඒක තේරුම් ගන්නෙ ඇස් දෙකෙන් බලල නොවෙයි. ප්‍රඥාවෙන්. ඒක තේරුම් ගත්තට පස්සෙ අපට තවත් යමක් දකින්නට ලැබෙනව. මොකක්ද ඒ? වේදනාව. වේදනාව කියන්නෙ ස්පර්ශය නිසා සිදුවන දෙයක්. ඒක දකින්න පුළුවන්. ඊළඟට සංඥාව. ඒකත් ස්පර්ශය නිසායි සිදුවන්නෙ. එතකොට ස්පර්ශයක් සිදු වුණේ නැත්නම් චේතනාවක් පහළ වෙනවද? නැ. ස්පර්ශයකින් තොරව චේතනාවක් පහළ වෙන්නේ නැහැ. එහෙනම් ඔන්න චේතනාවක් පහළ වෙනකොට ඒක සිද්ධ වෙන්නෙ ස්පර්ශය නිසා කියල දැනගන්නව.



නාම රූප

ඊළඟට සිත. සිත කියල අපි අල්ලා ගන්නේ මොකක්ද? සිත කියල විශේෂ දෙයක් දකින්න බැහැ. සිත දකින්න හැදුවොත් අපි දකින්නෙ මොකක්ද? ස්පර්ශය, වේදනාව, සංඥාව, චේතනාව, මනසිකාරය, මේවා තමයි දකින්නෙ හිත හැටියට. හිතය කියල විශේෂ දෙයක් අපට හොයන්න බැහැ. දකින්න බැහැ. එක්කො දැනීමක්, එක්කො හැඳිනීමක්, එක්කො චේතනාවක්, මේවා තමයි අපි හිත කියල අල්ලගන්නෙ. මොකද හේතුව? හිත කියන්නෙ නිකම් හටගත්තු එකක් නොවෙයි. හිත කුමක් ප්‍රත්‍යයෙන් හට ගත්තු එකක්ද? නාමරූප ප්‍රත්‍යයෙන්. හොඳට මතක තියාගන්න හිත හටගන්නෙ නාමරූප ප්‍රත්‍යයෙන්, හිත ඉබේ හටගන්නෙ නැහැ. "නාමරූප පච්චයා විඤ්ඤාණං" විඤ්ඤාණය හටගන්නෙ නාම රූප ප්‍රත්‍යයෙන්.

නාමරූප කිව්වෙ මොනවද? දැන් ඔන්න මතක තියාගන්න එතන තියෙන්නෙ තනිකරම මානසික ක්‍රියාවලියක් නොවෙයි. භෞතික ජීවිතයක සම්බන්ධයකුත් එක්කයි මානසික ක්‍රියාවලිය තියෙන්නෙ. භෞතික ජීවිතයක් කියල කිව්වෙ සතර මහා භූතයන්. සතර මහා භූතයන් ගෙන් හටගත්තු දෙයක් එක්කයි මේ පැවැත්ම තියෙන්නෙ. ඒවායින් මිදිල සිත පවතින්නේ නැහැ.

බුදු රජාණන්වහන්සේ වදාළ රූපයෙන් තොරව, විඳීමකින් තොරව, සංඥාවකින් තොරව, චේතනාවකින් තොරව (සංස්කාරයන්ගෙන් තොරව) විඤ්ඤාණයේ හට ගැනීමක් හෝ කර්ම රැස්වීම් වශයෙන් දියුණුවීමක් හෝ මෝරා යාමක් හෝ චුත වීමක් හෝ සිදුවන්නේ නැහැ කියල කවුරු හරි එහෙම කියනවා නම් ඒක "නේතං ඨානං විජ්ජති" ඒක සිදුවන දෙයක් නොවෙයි.

අන්න එතනදි උන්වහන්සේ ප්‍රකාශ කළා "කම්මං ඛෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙ හෝ" කර්මය කියන්නෙ කුඹුර, විඤ්ඤාණය කියන්නෙ බිජුවට. තණ්හාව කියන්නෙ වතුර. මෙන්න මේ තුන එකතුවෙලා තමයි පටිච්ච සමුප්පාදයට අවනත වෙච්ච ජීවිතේ සකස් වෙන්නෙ.

කර්මය කුඹුර, හිත බිජුවට, තණ්හාව වතුර. උන්වහන්සේ මේක සවිස්තරව පෙන්වනව. මේ මහපොළොව වගෙයි කියල විඤ්ඤාණය පිහිටන තැන් හතර. "චතස්සෝ විඤ්ඤාණම්ඨිතියෝ මොනවද මේ විඤ්ඤානය පිහිටන තැන් හතර?

රූප, වේදනා, සංඥා, සංඛාර අල්ලගෙන තමයි හිත පවතින්නෙ. මේ හතරින් තොරව විඤ්ඤාණයේ පැවැත්මක් ගැන කතා කරන්න බැහැ.

දවසක් දෙවි කෙනෙක් බුදු රජාණන්වහන්සේගෙන් ඇහැව්ව

"කුතෝ සරා නිවත්තන්ති
කත්ථ වට්ටං න වට්ටති
කත්ථ නාමං ච රූපං ච
අසේසං උපරුජ්ඣති"

මේ තණ්හාව නමැති ගංගාව නවතින්නෙ කොහෙන්ද? මේ දුක හදන වැඩපිළිවෙළ නවතින්නේ කොහේද? මේ නාම රූප දෙක ඒ කියන්නෙ අප කියූ අර සතර මහා ධාතූන් ගෙන් හටගන්නා දේවල් සහ ස්පර්ශය, වේදනාව, සංඥාව, චේතනාව, මනසිකාරය, මේව තමයි නාමරූප. ඉතින් මේ දෙවියා ඇහැව්වෙ මේ නාම රූප ඉතිරි නැතිව නැතිවෙන්නෙ කොහේද කියල.

බුදුරජාණන් වහන්සේ ඔහුට පිළිතුරු දුන්නා.

"යත්ථ ආපෝච පඨවි
තේජෝ වායො නගාධති
ඉතෝ සරා නිවත්තන්ති
එත්ත වට්ටං න වට්ටති
එත්ත නාමං ච රූපං ච
අසේ සං උප රුජ්ඣති"

යම් තැනක පඨවි, ආපෝ, තේජෝ, වායෝ පිහිටල නැද්ද? අන්න එතැන තමයි තණ්හා ගග නවතින තැන. තණ්හා ගග නැවතුණු තැන. එතැන තමයි දුක හදන වැඩපිළිවෙළ නැති තැන. මෙතන තමයි නාම රූප නැතිවන තැන. කොහේද ඒ? නිවන – අනික් හැම තැනම නාම රූපයන්ගේ පැවැත්ම තියෙනව.

**(ලබන සතියේ තවත් කොටසක්)**